www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 9 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම:.................................................... විභාග අංකය:....................................................

## I කොටස

සැලකිය යුතුයි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථයකි,
 1. හොසියා.
 2. එස්තර්.
 3. වීරාවලිය.
 4. ගීතාවලිය.

02. ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීම සඳහා ජනතාවට යහ මග පෙන්වන ඉගැන්වීම් අඩංගු ගීතාවලියේ ඇති ගීත වර්ගය වන්නේ,
 1. විශ්වාසයේ ගීතිකා.
 2. තුතිදීමේ ගීතිකා.
 3. ප්‍රඥා ගීතිකා.
 4. ප්‍රේම ගී.

03. රෝමයේ නීරෝ අධිරාජ්‍යයාගේ පීඩනයට ලක් වූ කිතුනුවන් දිරිමත් කිරීම තම ශුභාරංචියේ අරමුණ කර ගත් ශුභාරංචි කතුවරයා වන්නේ,
 1. ශුද්ධ වූ ලූක් තුමා.
 2. ශුද්ධ වූ මාක් තුමා.
 3. ශුද්ධ වූ මතෙව් තුමා.
 4. ශුද්ධ වූ ජොහන් තුමා.

04. සමදර්ශක ශුභාරංචි කතුවරු තිදෙනා ම සමානව දුටු ජේසුස් වහන්සේගේ ජීවිතයේ වැදගත් අවස්ථාව වන්නේ,
 1. බෞතීස්ම ස්නාපනය.
 2. ලාසරස් ව නැගිටුවීම.
 3. ස්වර්ගාරෝහණය.
 4. කන්ද උඩ දේශනය.

05. දෙවියන් වහන්සේ ආදම් සහ ඒවට හම් වස්ත්‍ර සාදා දීමෙන් සංකේතවත් කරන්නේ කුමක් ද?
 1. කරුණාව, ආදරය හා රැකවරණයයි.
 2. ප්‍රේමය හා ආරක්ෂාවයි.
 3. ගැලවීම ලැබෙන බවයි.
 4. සමාව දීමයි.



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

06. පුරාණ ගිවිසුමේ දේව අනුකම්පාවේ, කරුණාවේ හා ප්‍රේමයේ සංකේතයක් වූයේ,

1. සුළඟ  2. දේදුන්න.  3. වළාකුළ.  4. ජලය.

07. "නුඹට ඇති බලසම්පන්නකම මෙහෙයවා, මිදියන්වරුන් අතින් ඊශ්‍රායල්වරුන් ගලවන්න. නුඹ යවන්නේ මම ය." මෙලෙස දෙවියන් වහන්සේ වදාළේ,

1. සාමුවෙල්ට ය.  2. දෙබෝරාට ය.  3. ගිඩියොන්ට ය.  4. බාරාක්ට ය.

08. තම වරද පිළිගෙන මනස්ථාප වී "මම සමිඳාණන් වහන්සේට විරුද්ධව පව් කළෙමි." යනුවෙන් පැවසුවේ

1. සාවුල් රජු ය.  2. සලමොන් රජු ය.  3. සකේවුස් ය.  4. දාවිත් රජු ය.

09. ආදිමවුපියන්ගෙන් අපට උරුම වන පාපය හඳුන්වන නාමය වන්නේ,

1. ජම්ම පාපය.  2. කර්ම පාපය.  3. සුළු පාපය.  4. මරණීය පාපය.

10. <u>මොහුගේ</u> මව මොනිකා ය. ඇය ශුද්ධවන්තියකි. <u>මොහු</u> මවගේ බලවත් යාච්ඤා නිසා සිත් හැරීමට ලක් විය.

ඉහත වගන්තියේ මොහු යනුවෙන් හඳුන්වන්නේ,

1. ශුද්ධ වූ අම්බ්‍රෝසි තුමා.  2. ශුද්ධ වූ අගුස්තීනු තුමා.
3. ශුද්ධ වූ ජෙරම් තුමා.  4. ශුද්ධ වූ අන්තෝනි තුමා.

11. කෙනෙකු බරපතල ලෙස රෝගීව සිටින විට ඔහුට ආධ්‍යාත්මික ශක්තියත්, කායික සුවයත් ලබා දෙන දේව ප්‍රසාද නිධානය වන්නේ,

1. අභිෂේක ආලේපය.  2. ප්‍රසාද ස්නාපනය.
3. රෝගීන්ගේ ආලේපය.  4. සමඟි සන්ධානය.

12. A - උඩඟුව  B - තණ්හාව
C - දුප්පත්කම  D - අලසකම

ඉහත පාපයන් අතරින් මුල් අගුණ පාප පමණක් ඇතුලත් අක්ෂර සහිත පිළිතුර වන්නේ,

1. A, B, C  2. A, C, D
3. A, D, C  4. A, B, D

13. සිය දිවි හානි කර ගැනීමෙන් පෙන්නුම් කරන්නේ,

1. ජීවිතය නැවත දෙවියන් වහන්සේ වෙත බාර දීම.
2. තම කැමැත්ත අනුව ජීවිතය විනාශ කිරීම.
3. මෙලොව ජීවිත ප්‍රශ්නවලින් ජය ගැනීම.
4. දෙවියන් වහන්සේට අයිති වස්තුවක් තමන් සතු කර ගැනීමට උත්සාහ කිරීම.



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

14. තම ජීවිතය හා අන් ජීවිත සුරැකිය යුතු බව අපට උගන්වන දේව පනත වන්නේ,

1. 5 වන පනත.
2. 9 වන පනත.
3. 6 වන පනත.
4. 8 වන පනත.

15. පාපයෙන් මිදීමට මිනිසාට අත්‍යාවශ්‍යම දෙය වන්නේ,

1. තම ආත්ම ශක්තියයි.
2. ශුද්ධාත්ම වරප්‍රසාද හා බලයයි.
3. මිතුරන්ගේ සහයෝගයයි.
4. ආගම පාඩම ඉගෙන ගැනීමයි.

16. රෝමානු ආණ්ඩුකාරවරයාගෙන් ලද ත්‍යාගය ප්‍රතික්ෂේප කරමින් "මම ස්වර්ගීය රජාණන්ගේ පුතණුවන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමඟ විවාහ වුණෙමි." යනුවෙන් පැවසුවේ,

1. ශු. මරිය ගොරෙත්ති තුමිය.
2. ශු. මොනිකා තුමිය.
3. ශු. ඇග්නස් තුමිය.
4. ශු. මරිය මග්දලේනා තුමිය.

17. අප වෙත පැන නගින අසහනකාරී තත්වයන් හමුවේ ස්ථිර ඇදහිල්ලෙන් කළ යුතු දෙයක් වන්නේ,

1. වන්දනා ගමන් යාම.
2. දාන ධර්ම දීම.
3. එකිනෙකාට උදවු කිරීම.
4. දෙවියන් වහන්සේට යාච්ඤා කිරීම.

18. හොඳ නරක දැන ගන්න පුළුවන් වන ලෙස ඥානවන්ත සිතක් ඉල්ලා දෙවියන් වන්සේට කන්නලව් කළ රජතුමා වූයේ,

1. දාවිත් රජතුමා.
2. සාවුල් රජතුමා.
3. සලමොන් රජතුමා.
4. ශෙදකියා රජතුමා.

19. ආසියාතික රටවල රදගුරු තුමන්ලාගේ සාංඝිකත්වයේ හා ගැඹුරු භාවනාවේ ප්‍රතිඵලයක් ලෙස බිහි වූ සංවිධානය කුමක් ද?

1. තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරය.
2. අසිපා ක්‍රියාවලිය.
3. මරිය හමුදාව.
4. කිතුදන පුබුදුව.

20. යාච්ඤාව මඟින්,

1. දෙවියන් වහන්සේ සමඟ ගැඹුරු දේව සම්බන්ධතාවයක් ගොඩ නගා ගත හැකි ය.
2. තමාගේ අවශ්‍යතා ඉල්ලා ගත හැකි ය.
3. අන් අය වෙත අයහපත ප්‍රාර්ථනා කළ හැකි ය.
4. පැමිණෙන සියලු දුක් වේදනාවලින් ඈත් විය හැකි ය.

(ලකුණු 02 × 20 = 40)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

## II කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද, තෝරා ගන්නා අනෙකුත් ප්‍රශ්නයකට ලකුණු 11ක් ද බැගින් හිමි වේ.

01. ''දේව පනත්'' ඇසුරින් ඔබ කරන ලද ක්‍රියාකාරකම උපයෝගී කරගෙන පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ''ජීවිතය දෙවියන් වහන්සේ සතු අමිල වස්තුවකි.'' මෙම කියමන හා බැඳි දේව පනත නම් කරන්න. (ල. 02)
2. අන් අයගේ ජීවිත සුරැකීම සඳහා ඔබට කළ හැකි දේවල් දෙකක් ලියන්න. (ල. 02)
3. පාරිශුද්ධ ජීවිතයක් ගත කිරීමට කළ හැකි දේවල් දෙකක් ලියන්න. (ල. 04)
4. ගබ්සාව යනු කුමක් ද? (ල. 04)
5. ඔබගේ ශරීර සෞඛ්‍ය රැක ගැනීම සඳහා ඔබට කළ හැකි දේවල් හතරක් ලියන්න. (ල. 04)

02. 1. පුරාණ ගිවිසුමේ පංච පුස්තකයට අයත් පොත් දෙකක් නම් කරන්න. (ල. 02)
2. නව ගිවිසුමේ පොත් 27 බෙදෙන ප්‍රධාන කොටස් තුන නම් කරන්න. (ල. 03)
3. කරදර හා ආපදා අවස්ථාවල සහනය පතා දෙවියන් වහන්සේට ඔබ කරන යාච්ඤාවක් ලියන්න. (ල. 06)

03. 1. ශුද්ධ වූ මතෙව් ශුභාරංචිය සඳහා භාවිත වන වෙනත් නම් දෙකක් ලියන්න. (ල. 02)
2. ශුද්ධ වූ ජොහන් ශුභාරංචිය තුළ ඇති ''මම වෙමි'' ප්‍රකාශ තුනක් ලියන්න. (ල. 03)
3. ආලෝකයේ දරුවන් ලෙස ඔබට යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා කළ හැකි දේවල් හයක් ලියන්න. (ල. 06)

04. 1. වරදට වැටුණු කායින්ට දෙවියන් වහන්සේ දුන් දඬුවම් දෙකක් ලියන්න. (ල. 02)
2. අප වරදට වැටෙන විට අපව නිවැරදි මාර්ගයට ගැනීමට අවවාද කරන පුද්ගල කණ්ඩායම් තුනක් නම් කරන්න. (ල. 03)
3. එඩිතර නායකයෙකු ලෙස ඔබ පන්ති කාමරය තුළ ක්‍රියා කරන ආකාරය පිළිබඳ කරුණු තුනක් විස්තර කරන්න. (ල. 06)

05. 1. දේව වරප්‍රසාද කොටස් දෙක නම් කරන්න. (ල. 02)
2. ස්වර්ගයට මොර ගසන පාපයන් තුනක් නම් කරන්න. (ල. 03)
3. නැතිවුණ පුත්‍රයා පිළිබඳ උපමාව ලියා එම උපමාව මගින් අපට ලැබෙන පණිවිඩ තුනක් ලියන්න. (ල. 06)

06. 1. පාපයට ලැබෙන දඬුවම් වර්ග දෙක නම් කරන්න. (ල. 02)
2. යමෙකුට රෝගීන්ගේ ආලේපය ලබා දීමට සුදුසු අවස්ථා තුනක් ලියන්න. (ල. 03)
3. රෝගීන්ගේ ආලේපය සිදු කරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)

07. 1. ශුද්ධ බයිබලයේ නව ගිවිසුම තුළ අඩංගු ප්‍රශංසා ගීත දෙකක් නම් කරන්න. (ල. 02)
2. යාච්ඤාවේ ප්‍රභේද තුන නම් කරන්න. (ල. 03)
3. ඔබගේ ජීවිතයේ දී දෙවියන් වහන්සේට ප්‍රශංසා කළ අවස්ථාවක් විස්තර කරන්න. (ල. 06)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk